# 13 වෙනි ගිරිනාර්ගිරි ලිපියෙන් ප්‍රකට වන අශෝක ධර්ම ප්‍රචාරය පිළිබඳ විමසුමක්

දිවුලපැලැස්සේ විමලානන්ද හිමි

## ප්‍රවේශය

මධ්‍යතන ඉන්දු ආර්ය භාෂා යුගයේ ප්‍රථම යුගයට අයත් ලිපි විශේෂයක් වශයෙන් අශෝක ශිලා ලේඛන සැළකේ. අශෝක ලිපිවල භාෂාව එම පැරණි ස්වරූපයෙන් ම ශිලා ලේඛනගතව ඇති බැවින් භාෂා සංවර්ධනය පරීක්‍ෂා කිරීමේ දී ද පාලි ත්‍රිපිටක ග්‍රන්ථවලට වඩා වැදගත් තැනක් එම ලිපිවලට ලැබේ. අශෝක රජු ස්වකීය ජනතාවට ආඥා නිකුත් කිරීමේ දී ඒ ඒ පළාත්වල ප්‍රචලිත භාෂාවන්ට අනුරූපවම ලේඛන සකස් කර එමගින් ස්වකීය ජනතාවට ආඥා නිකුත් කර තිබේ. ඇතැම්විට එකම කාරණය විවිධ ප්‍රදේශවල දී ඒ ඒ ප්‍රදේශගත භාෂාවලින් සටහන් වී ඇත. ඒ අනුව ක්‍රි. පූ. 274-232 කාලයේ ඉන්දීය අර්ධද්වීපය තුළ භාවිත වූ ඇතැම් භාෂාවල තත්ත්වය ද වටහා ගැනීමට අශෝක ලිපි මගින් හැකියාව ලැබී තිබේ.

අශෝක රජු තමන්ගේ සෙල්ලිපිවල 'දෙවානම්පිය පියදසි' නමින් තමන් හඳුන්වා ඇත. මෙසේ'දෙවානම්පිය පියදසි' යනු කවරෙක් ද යන්න දීර්ඝ කාලයක් තුළ විවාදයට තුඩුදුන් කාරණයක් විය. එහෙත් 'මස්කි' ලිපියෙහි 'දෙවානම් පියස අශෝකස' යන පාඨය සඳහන්ව ඇති බැවින් නිශ්චිතවම දෙවානම්පිය පියදසි යනු අශෝක විය යුතු බවට තහවුරු කර ගැණුනි. ඒ අනුව ක්‍රි. පූ. 274-232 කාලයේ භාරතයේ

අධිරාජ්‍යයෙකු ලෙස පාලනය කළ මෞර්ය වංශික අශෝක මේ තැනැත්තාම බව හඳුනාගනී.

ඉන්දියාවේ විවිධ ස්ථානවලත් දේශසීමා ප්‍රදේශවලත් දක්නට ලැබුණු ශිලා ලිපි 40 ක් පමණ වේ. මේ අතර ප්‍රධානත්වයෙහිලා සැලකෙන ලිපි 14 ක් විචාරකයින්ගේ අවධානයට යොමු වී ඇත. ඒවායේ පිටපත් ගිර්නාත්, කාල්සි, සාබස්ගර්හි, මාන්සේරා, ධෞලි, ජෞගදා, සොප්‍රා යන ස්ථානවල ද දක්නට ලැබේ.[1]

අශෝක ශිලා ලිපිවල කාලය සඳහන් කර ඇත්තේ වෙනත් බොහෝ රජුන් මෙන් අභිෂේක වර්ෂය ගණනය කිරීමෙනි. ලක්දිව වංශකථා සහ වෙනත් මූලාශ්‍ර කීපයක ඇතුළත් තොරතුරු අනුව අශෝකගේ අභිෂේකය සිදුව ඇත්තේ ඔහුගේ පියා වූ බින්දුසාරගේ අභාවයෙන් වසර 4 කට පසුවය. ඇතමුන් අදහස් කරන්නේ එම කාලය තුළ ඔහු සිය සොහොයුරන් සමඟ රාජ්‍ය උරුමය සම්බන්ධයෙන් සටන් වදින්නට ඇති බවයි. එහෙත් තව පිරිසක් මේ මතයට විරුද්ධව කරුණු ඉදිරිපත් කර තිබේ. අශෝක සිය අභිෂේකයේ දී සිරකරුවන්ට නිදහස ලබා දී තිබේ. එමෙන්ම 'තිෂ්‍ය' හා 'පුනර්මසු' දිනවල සතුන් මැරීම තහනම් කරතිබේ. මේ දින පිළිවෙලින් ඔහුගේ ජන්ම දිනය හා අභිෂේක දිනය ලෙස සැලකිය හැකි බව ඇතැම් ඉතිහාසඥයන්ගේ මතයයි. ඒ අනුව අශෝකගේ අභිෂේක වර්ෂය ක්‍රි.පූ. 274 ලෙසත් වසර 42 ක් රාජ්‍ය කල ඔහු ඔහුගේ අභාවයෙන් පසු ක්‍රි. පූ. 232 දී එය අවසන් වන්නට ඇති බවත් අනුමාන කල හැකිය. එහෙත් මේ කාලවකවානුව පිළිබඳ ඉතිහාසඥයන්ගේ විවිධ මතභේද පවතී.

රජවරු බොහෝවිට සිය ලිපිවල අන්තර්ගත කොට ඇත්තේ ඔවුන් විසින් කරනු ලැබූ ප්‍රසාද දීමනා හා ඔවුන්ගේ ප්‍රශස්ති ගුණ වර්ණනාවන්ය. අලහබාද් ප්‍රශස්තිය එක් නිදසුනකි. එහෙත් අශෝක ලිපි සම්බන්ධයෙන් එබඳු ලක්ෂණ ඉතා අඩුය. ඔහු සිය පෞද්ගලික අත්දැකීම් වින්දනය, රාජ්‍ය පාලනයට අවශ්‍ය උපදෙස්, සුභසාධක කටයුතු, ධර්මචර්යාවේ අනුසස් ආදී කරුණු තමාගේ ලිපිවලට බෙහෙවින් අන්තර්ගත කර තිබේ.



අශෝක තමා ධර්ම යාත්‍රාවේ නිරත වූ බව රුම්න්දෙයි හා නිග්ලීව යන ටැම්ලිපි මගින් දක්වා තිබේ. නිදර්ශනයක් වශයෙන් ඔහුගේ 8 වෙනි ගිරි ලිපිය සම්බෝධිය සිදු වූ ස්ථානය වන බුද්ධගයාව වන්දනා කිරීමට ගිය බව සඳහන් වේ. එහෙත් එම ලිපිය ඒ සඳහාම ලිය වූ එක්ක නොව, ඔහු ධර්ම යාත්‍රා මගින් අපේක්ෂා කළ අරමුණු ඉටුකිරීමකි. ඔහුගේ 4 වෙනි ගිරි ලිපියෙන් ද වඩාත් අවධාරණය වන්නේ අශෝක රජු විසින් සිදුකල ධර්ම යාත්‍රා පිළිබඳවයි. මෙම ලිපිවල ඇති තවත් වැදගත් කාරණයක් නම් රජු මේ ලිපිවලින් ආමන්ත්‍රණය කරන්නේ තම යටත් වැසියන්ටම පමණක් නොවේ. අසල්වාසී රටවල හා පොදුවේ සමස්ත සමාජයටම ආමන්ත්‍රණය කරමින් මේ ලිපි ලියා තිබීමයි. නිදර්ශන වශයෙන් සිද්ධපුර, මස්කි යන ස්ථානවලින් සොයාගත් ලිපි ඉදිරිපත් කළ හැකිය.

ස්වකීය රාජ්‍යයට තදාසන්න දේශසීමාවල පිහිට වූ ලිපිවල අරමුණ වී ඇත්තේ ඒ ප්‍රදේශවාසීන්ට උපදෙස් ලබා දීමටය. විශේෂයෙන් ම කාලිංග ලිපිය එම ප්‍රදේශයේ සිදු වූ යුද්ධයේ දී ඇති වූ විනාශයත් කම්පනයත් එමෙන් ම ඒ ප්‍රදේශය යථාතත්ත්වයට පත් කර ගත යුතුය යන අදහසත් දෙනු ලබන්නෙකි.

සංඝභේදය සම්බන්ධයෙන් සාරානාත් හි පිහිටුවා ඇති ලිපිය ද රජුගේ ආකල්පය දක්වා ඇත. වැරදි චර්යාවන්හි නිරත වන භික්ෂු භික්ෂුණීන්ට සුදු පිලි ඇන්ද විය යුතු බව ඔහුගේ අදහසයි. තව ද පැළලුප් නුවර හෝ වෙනත් ස්ථානයක යමෙක් විසින් සංඝභේදය නොකළ යුතුය, යම් භික්ෂුවක් හෝ භික්ෂුණියක් එසේ කරන්නේ නම් ඔවුන්ට සුදු පිලි ඇන්දවිය යුතුය. එම විහාරයෙහි වාසය කිරීම ද අහිමි කළ යුතුය. මෙවැනි අදහස් කෞසාම්බි ලිපිය මගින් ද ඉදිරිපත් කර ඇත. මෙසේ අශෝක ශිලා ලිපි ධර්ම ප්‍රචාරයට මෙන් ම සමාජ යහපැවැත්ම සඳහාද ධර්ම කරුණු ඉදිරිපත් කෙරෙන ප්‍රශස්ත ලේඛනාවලියකි. ඒ අතුරින් 13 වෙනි ගිරිනාර් ගිරි ලිපියෙහි සමාජ දේශපාලනික වටිනාකම පිළිබඳ විමර්ශනය කිරීම මෙහි අරමුණයි.

### 13 වෙනි ගිරිනාර් ගිරි ලිපිය[2]

අශෝක රජු කාලිංගය යටත් කලේ අභිෂේක කොට අටවන වර්ෂයෙහි බව ගිරිනාර්හිපිහිටි 13 වන ගිරිලිපියේ අශෝක රජතුමාම සඳහන් කරයි. වංසකථාවලට අනුව අශෝක රජ බෞද්ධ වූයේ අභිෂේක කොට වර්ෂ තුනකිනි. මහින්ද කුමරුන් පැවිදි කලේ වර්ෂ හයකිනි. ඒ වන විට විහාර අසූහාර දහසක් පූජාකොට අවසන්ය. එහෙත් 13 වෙනි ගිරි ලිපියට අනුව කාලිංග යුද්ධය අටවසකින් සිදු වී තිබේ. එතරම් බෞද්ධ ප්‍රතිපත්ති මාර්ගයකට පැමිණුනාට පසු කාලිංග යුද්ධයක් සිදුකොට මිනිසුන් ලක්‍ෂ ගණන් විනාශ කිරීමක් සිදුවිය නොහැකිය. එනිසා වංශකථාවලට අනුව අභිෂේක කර තුන් වසක් ගිය තැන රජු බෞද්ධ ප්‍රතිපත්ති ගැන සැලකිල්ලක් දක්වා නැතැයි පිළිගැනීමට සිදු වේ. මේ අනුව ලක්දිව වංසකතා තොරතුරු සහ අශෝක ශිලාලේඛන තොරතුරුවල අසමතුලිත බවක් දැකිය හැකිය.

මෙම ලිපියට අනුව මුලින් ම දක්වන්නේ අභිෂේක කොට වර්ෂ අටක් ඉක්මවීමෙන් පසු දෙවියන්ට ප්‍රිය වූ පියදස්සී රජු විසින් කාලිංගයෝ දිනන ලද බවයි. (**අඨවෂාභිසිතෂා දෙවානංපියස පියදෂිනෙ ලාජිනෙ කලිගථා විජිතා**) මෙම මහා සංග්‍රාමයේ දී මිනිසුන් එක් ලක්‍ෂ පණස් දහසක් පමණ පැහැරගැනීමට ලක් වූ බවත් (**දියඪමාතෙ පාන ෂතෂහශෙ යෙ තථා අපවුඪෙ**) ලක්‍ෂයක් පමණ යුද්ධයේ දී මරණයට ලක්කළ බවත් (**ශතෂහෂ මාතෙ තත හතෙ**)ඒ හා සමාන කීප ගුණයක් හෝ මරණයට පත් වූ බවත් (**බහුතාවංතකෙ වා මටෙ**) තමා විසින් ම පසුතැවිල්ලෙන් යුතු පුනරාවර්ජනයක නිරත වෙයි.

### ධර්මානුශාසනා

කාලිංග දේශය ජයග්‍රහණයෙන් පසු දෙවියන්ට ප්‍රිය වූ රජුගේ තියුණු වූ ධර්ම රක්‍ෂණය ද (**ධංමවායෙ**) දැහැමි කර්මාන්ත ද (**ධංමකාමතා**) ධර්මානුශාසනය ද (**ධංමානුෂටී**) පවත්වන්නට විය. කාලිංගය ජය ගත්තත්රජුට පසුතැවිල්ලක් මිස සැනසීමක්



නොවීය. යුද්ධයේ දී යම් සත්ව හිංසාවක් හෝ මරණයක් හෝ මිනිසුන් පැහැරගෙන යෑමක් හෝ ඇති වුනි නම් එයින් ලබා ගත් යුධ ජයග්‍රහණය නියම දිනීමක් නොවන බව රජු විසින් සිතන්නට විය.

සියලු දෙනා වෙත සානුකම්පිත දෘෂ්ටියකින් කටයුතු කරන්නට වූ බව තමන් විසින් ම ඉදිරිපත් කර ඇත. එනම් තම රටෙහි බ්‍රාහ්මණ, ශ්‍රමණ හෝ වෙනත් අන්‍යආගමික පූජ්‍යකයෝ හෝ ගෘහස්තයෝ හෝ වෙත් ද (**බංහනා වා ෂමනාවා අනෙවා පාශංඩ ගිහිථා වා**) ඒ සියලු දෙනා වෙත පැවැත්විය යුතු ධර්ම මාලාවක් පෙන්වා දෙයි. එනම් වැඩිමහල්ලන්ට සේවා කිරීම (**අගභුත ෂුෂුෂා**), මව්පියන්ට සේවාකිරීම (**මාතා පිති ෂුෂුෂා**), ගුරුවරුන්ට සේවාකිරීම (**ගලු ෂුෂුෂා**) විශේෂයෙන් අවධාරණය කරයි. එසේ ම මිත්‍රයෝ ඇසුරු කරන්නෝ, සහායකයෝ, නෑයෝ යන මොවුන් කෙරෙහි ද (**මිතෂංථුතෂහායනාතිකෙෂු**) දාසයන් හා සේවකයන් කෙරෙහි ද මනා ලෙස පිළිපැදීම ද දෘඪ භක්ති ඇති බව ද වේ නම් (**දාශභතකෂි ෂම්‍යා පටිපති දිඪභතිතා**) එහි දී ඔවුන්ට හිංසා කිරීමක් හෝ මරණයක් හෝ ඇලුම් කරන්නවුන්ගේ නික්මයාමක් හෝ නොවිය යුත් බවත් (**තෙෂං තතා හොති උපඝාතෙ වා වධෙ වා අභිලතානං වා විනිඛමනෙ**) සඳහන් කරයි. එනම් රටේ සියලු ජනයා කෙරෙහි ගිහි පැවිදි, උස් පහත් භේදයකින් තොරව සේවය කිරීම සහ සැළකීම සිදුකළ යුතු බව තමන්ගේ දර්ශනය තුළ පැහැදිළිව දක්වා තිබේ. රාජ්‍ය නායකයෙකු විසින් සිදුකළ යුතු මනා පිළිවෙත් මාලාවක් වශයෙන් අශෝක රජු ඉදිරිපත් කර ඇති ඉගැන්වීම තුළ දැකිය හැකිය.

යුද්ධයට පත්වූවන් පිළිබඳව යමෙකුගේ ස්නේහය දුරු නොවිය යුතු බවත් ඒ සියලු දෙනාගේ ඥාති මිත්‍රාදීහු කෙරෙහි ද විනාශයක් ඇති වේ නම් එය ද (**පටිභොගෙ වා එෂ ෂවමනුශානං ගුලුමතෙ වා දෙවානංපියෂා**) ඔවුන්ට ම පීඩාවක් වන බවත් සලකා ඇත. මෙය රජු විසින් ඉතා අවධානයෙන් යුතුව කල්පනා කළ සිතිවිල්ලකි.

## ධර්ම ප්‍රචාරයේ ස්වභාවය

භාරතය ධර්මද්වීපයක් බවට පත් කිරීමට අශෝක නිරිඳුන් ගත් ක්‍රියාමාර්ගය වූයේ ධර්ම මහාමාත්‍යවරු පත් කිරීමයි. ඔවුන්ට පැවරුණු ප්‍රධාන වගකීම වූයේ මුළු භාරතය පුරාවටම ධර්මය ව්‍යාප්ත කිරීමයි. රජුගේ ආඥාවට අනුව ධර්ම මහාමාහත්‍යවරුන් ධර්ම ප්‍රචාරය සඳහා නොගිය ජනපදයක් නොමැති බව සඳහන් කරයි. (**නථි චා ෂෙ ජනපදෙ යතා නථි ඉමෙ නිකායා**) බ්‍රාහ්මණ, ශ්‍රමණ හෝ කවර දහමක් කෙරෙහි හෝ පැහැදීමක් නොමැති කිසිදු ජනපදයක වෙසෙන මිනිසෙක් නොවන බව (**නථි චා කුචා පි ජනපදෂි යතා නථි මනුෂානං එකතලෂි පි පාෂඩසි නො නාම පෂාදෙ**) මෙහි විශේෂයෙන් අවධාරණය කරයි

කාලිංග යුද්ධයෙන් පසු රජු අතිශයින් කළකිරීමට පත්විය. යුද්ධයේ දී සහ යුද්ධයෙන් පසු ඇති වූ මානුෂීය හිංසා සහ කරදරත් මිනිස් මරණත් පිළිබඳ නැවත නැවත රජු විසින් සිහිපත් කරන්නට විය. එම පුනරාවර්ජනය රජුගේ ධාර්මික ක්‍රියා පිළිවෙත පැවැත්වීමට අතිශයෙන් උපකාරී විය. මෙහි දී ඉවසීම විශේෂයෙන් ප්‍රගුණ කළ යුතු ගුණාංගයක් බව විශේෂයෙන් අවධාරණය කරයි. (**යො පි ච අපකරෙයති ඤමිතවියමුතෙ ච දෙවානං ප්‍රියස යං ශකො ඤමනයෙ**) යමෙක් යම්බඳු අපකාරයක් කෙරේදඑවැනි අවස්ථාවක ඉවසිය හැකි නම් එය ඉවසිය යුතු යයි රජු විසින් සළකන ලදි.

රටෙහි ධාර්මිකත්වය කෙතෙක් ප්‍රචලිත වීද යත් වනචරයෝ පවා රජු කෙරෙහි පැහැදී එයින් ඉවත්ව තමන් විසින් සිදුකළ ප්‍රාණඝාතාදිය පිළිබඳ පසුතැවිලි වූ බව සඳහන් කරයි. සතුන් මැරීම පසුතැවිලි විය යුතු කරුණක් බවත් සියලු සතුන්ගේ පීඩා රහිත බව, සංයමය, සමචර්යාව සහ සතුටින් විසීම (**ෂව භූතානං අක්‍ෂති ෂයම ෂමචලියං මදව ති**) රජු විසින් අපේක්‍ෂා කර ඇත.



## ධර්ම ප්‍රචාරය කළ ස්ථාන

අශෝක ශිලා ලේඛනවලින් 13 වෙනි ගිරි ලිපිය අශෝක රජුගේ ධර්ම ප්‍රචාරය පිළිබඳ පැහැදිලි විවරණයක් ඉදිරිපත් කරන්නෙකි. අභිෂේකයෙන් 27 වෙනි වර්ෂයෙහි මෙය පිහිට වූ බවත් එහි එතුමන් ධර්ම ප්‍රචාරය කළ ස්ථාන පිළිබඳ සම්පූර්ණ විස්තරයත් දැකිය හැකිය. මෙහි ස්ථාන වශයෙන් 18 ක් නම් කර ඇත. මෙයින් ස්ථාන 13 ක්ම පිහිටා ඇත්තේ භාරතයේ ය.

> **ඉයං චු මුඛභුතං විජයෙ දෙවානං පියෂා යෙ ධංමවිජයේ ෂෙ ච පුනාලධෙ දෙවානංපියසා හිද ච ෂවෙෂු ච අතෙෂු අෂෂු පි යොජනෂතෙෂු අත අතියොගෙ නාම යොනලාජා පලං චා තෙනා අංති යොගෙනා චතාලි ලජානෙ තුලමයෙ නාම අංතෙකිනෙ නාම මකා නාම අලික්‍යුෂුදලෙ නාම නිචං චොඩපංඩියා අවං තම්බපංනි යා හෙවමෙව හිද ලාජාවිශවජි යොනකං බොජෙෂු නාභකෙ නාභපංතිෂු භොජපිති නිකෙ‍යෂු අධපාලදෙෂු.**

1. හිද - මෙහි හෙවත් මගධයයි.
2. අතෙෂු - දේශ සීමා ප්‍රදේශයි.
3. අතියොගෙ - සිරියාවේ සිටි Antiochos (ක්‍රි.පූ. 261 - 246) ග්‍රීක රජුගේ රාජ්‍යයයි.
4. තුලමයෙ - මිසරයේ Ptolemy II Philandelphas (ක්‍රි.පූ. 285 - 247) රජුගේ රාජ්‍යයයි.
5. අංතෙකිනෙ - මැසිඩෝනියාවේ Antigonus Gonatus (ක්‍රි.පූ. 276 - 239) රජුගේ රාජ්‍යයයි.
6. මකා - බටහිර මිසරයේ Magas (ක්‍රි.පූ. 300 - 258) නම් වූ රජතුමාගේ රාජ්‍යයයි.
7. අලික්‍යෂුදලෙ - එපිරස්හි Alexander (ක්‍රි. පූ. 272 - 258) රාජ්‍යයයි.

8. **චොඩ** - චෝල රාජ්‍යයයි.
9. **පංඩියා** - පාණ්ඩ්‍ය රාජ්‍යයයි.
10. **තම්බපංණි** - තාම්‍රපර්ණි ප්‍රදේශය හෙවත් ලංකාවයි.
11. **යොන** - ග්‍රීකවරුන්ගේ පාලනයෙහි තිබූ ඉන්දියානු ප්‍රදේශයි.
12. **කංබෝජ** - කාම්භෝජයයි.
13. **අධ** - ආන්ද්‍ර රාජ්‍යයයි.
14. **පාලද** - පුලින්ද ජනපදයයි.
15. **නාභක** 16. **නාභපන්ති** 17. **භොජ** 18. **පිතිනික්‍ය** යන සතර භාරතයේ පැවැති ස්ථාන ලෙස සැලකේ.[3]

මෙම ස්ථාන 18 හිම අශෝක රජුගේ දූතයන් ගිය බවත් ඒවායේ එතුමාගේ ධර්මානුශාසනයන් පිළිගෙන තිබූ බවත් සඳහන් වේ. මෙම ශිලාලේඛනයෙහි සඳහන් ධර්ම ප්‍රචාරය සැක කිරීමට කරුණක් නැති අතර මේ තොරතුරු සනාථ කිරීමට තවත් සාධක ද දැක්විය හැකිව තිබේ. ආචාර්ය භණ්ඩර්කාර් දක්වන්නේ සේල්‍යුකියන් රාජ්‍යයෙන් තෙවරක් රාජ දූතයන් මෞර්ය රජුවෙත පැමිණ ඇති බවයි. මිසරයේ Ptolemy II Philandelphas රජු මෞර්ය රාජ්‍ය සභාවට රාජ දූතයන් එවූ බව ද නිසැක ලෙස පිළිගෙන තිබේ. එසේ නම් අශෝක රජුගේ දූතයන් එහි යැම ප්‍රතික්ෂේප කිරීම යුතු නැති බවයි.

අශෝක රජ ප්‍රචාරය කළ ධර්මය කුමක් ද යනු එතුමාගේ ශිලා ලේඛනවලින් පැහැදිලිව දැකිය හැකිය. එතුමන්ගේ ධර්ම ප්‍රචාරයෙන් අදහස් කලේ සෙසු ලෝකයාට බුද්ධ භක්තිය වැළඳ ගැනීමට සැලැස්වීමක් නොවේ. එතුමා බෞද්ධයකු වූ බව සත්‍යයකි. එතුමන් මස්කි ගිරි ලිපිය වැනි තැන්වල පැහැදිලිම තමන් බුදුරදුන්ගේ අනුගාමියෙකු බව සඳහන් කරයි. එහෙත් එතුමාගේ ධර්ම ප්‍රචාරය අනුන්ගේ ඇදහීම් ක්‍රමයක් මාරු කිරීමට සීමා වූ දෙයක් නොවේ. එතුමන්ගේ අවංක විශ්වාසයට අනුව ප්‍රචාරය කළ ධර්මය බෞද්ධ ඉගැන්වීම්වලට අනුකූලව පිලියෙළ



වී තිබේ. එහෙත් එය සෘජුව බුද්ධ ධර්මය නොවේ. බුද්ධ ධර්මයට අනුව සකස් වූ ජීවන රටාවකි. එය අශෝක රජුගේ පිළිගැන්ම අනුව බෞද්ධ ජීවන රටාවයි. මෙම ලිපිය අශෝක රජුගේ පරිණත අවස්ථාව පිළිබිඹු කරන්නෙකි. මෙහි දී රජු ප්‍රචාරය කලේ කවර ආගමිකයන් විසින් වුව ද අනුගමනය කළ හැකි සාමාජික සුචරිතයකි. දාස සේවකයන් කෙරෙහි මනාව පිළිපැදීම මවුපියන්ට උපස්ථාන කිරීම, මිත්‍රයන්ට, සහායකයන්ට, ඥාතීන්ට සැලකීම, බ්‍රාහ්මණ ශ්‍රමණයන්ට සැලකීම වැනි පොදු සුචරිත ක්‍රියාවන් මෙයින් ප්‍රචාරය කර තිබේ.

එතුමන්ගේ ධර්ම ප්‍රචාරය තුළ දැකිය හැකි විශේෂත්වය නම් සෑම ආගමිකයෙකුටම පිළිගත හැකි ධර්ම නීති මාලාවකින් යුක්ත වීමයි. අන්‍යාගමිකකරණයක් කිසිදු ලිපියකින් දැකිය නොහැකිය. සියලුම ආගමික කණ්ඩායම්වලට පොදුවේ ආමන්ත්‍රණය කළ ආකාරයක් දැකිය හැකිය.

මොග්ගලීපුත්තතිස්ස තෙරුන් ඇතුළු තෙවැනි සංගීතිකාරක තෙරවරු ධර්ම ප්‍රචාරයෙහි යෙදීම පිළිබඳ තොරතුරක් අශෝක ලිපිවලින් දැකිය නොහැකිය. අශෝක රජු කිසිතැනක භික්ෂූන් ධර්ම ප්‍රචාරය සඳහා යැවූ බවක් ශිලාලේඛනවල සඳහන් කොට නැත. රජු යැවූ දූතයන් අතර වූයේ ලජුක, ධංම මහාමත, පුලිස, දූත යන නම් වලින් සඳහන් අය පමණි. එහෙත් භික්ෂූන් පිළිබඳ සඳහන් නොවේ.

මේ අනුව ධර්ම ප්‍රචාර ක්‍රම දෙකක් සිදුවී ඇත. එසේම ලක්දිව වංශ කථාවල දැක්වෙන බුදුදහම ප්‍රචාරක රටවල් සහ අශෝක ලිපිවල දැක්වෙන රටවල් එකිනෙකට නොගැලපේ. එනිසා මෙය ධර්ම ප්‍රචාර ක්‍රම දෙකක් ලෙස සැලකීම වඩාත් සුදුසු වෙයි.

මේ සෑමතැනම රජුගේ ධර්මානුශාසනය අනුගමනය කරන ලදි. යම් තැනක රජුගේ දූතයෝ නොයෙත් නම් එහි වැසියෝ ද රජුගේ ධාර්මික පැවැත්ම, විධානය හා ධර්මානුශාසනය අසා ධර්මය අනුකරණය කළ බවත් මත්තෙහි ද අනුකරණය කරන

බවත් (ධමචුතං විධනං ධංමානුසථි ධංමං අනුවිධියංති අනු විධියිසංති චා) දක්වයි.

රජු යම් ප්‍රීතියක් ලබන ලද ද ඒ සියලුම ප්‍රීතිවලට වඩා ධර්ම විජයෙන් ලද ප්‍රීතිය උසස් බව (ගධා සා හොති පිති පිති ධංමවිජයෂි) අවධාරණය කරයි. එය මෙලොවට පමණක් නොව පරලොවට ද මහත්ඵල ලබා දෙන උතුම් ප්‍රීතියක් ම බව (පාලංතිකාමෙව මහඵලං මංනත) සලකන ලදි.

## සමාලෝචනය

13 වෙනි අශෝක ශිලා ලේඛනය ඉතා විධිමත් අයුරින් සංග්‍රහ කර ඇති ලේඛනයක් බව එය විමර්ශනය කිරීමෙන් මනාව පැහැදිලි වේ. මූලික කරුණු ඉදිරිපත් කිරීමෙන් අනතුරුව මෙවැනි ලිපියක් ලිවීමේ අරමුණ අවසානයේ ඉදිරිපත් කර තිබීම තුළින් ඒ බව තවදුරටත් තීව්‍ර වේ. මෙම ලිපිය ලිවීමේ මූලික අරමුණු කීපයක් ඉදිරිපත් කර ඇත්තේ මෙසේය. එනම් 'පුතා පාපොතා මෙ අසු (මාගේ පුත්‍රයෝ ද මුණුබුරෝ ද අසත්වා), නවං විජය ම විජයංතවිය මනිෂු (අලුත් විජයක් දිනීමට නොසිතන්න), ෂයකෂිනො විජයෂි ඛංතී චා ලහුදංඩ තා චා ලොචෙතු (ජයග්‍රහණයෙහි ආවුධ ගත්තෝ අවසානයෙහි සාමය හා අල්ප වූ දඬුවම් ඇති බව කැමැති වෙත්වා), තමෙව චා විජයං මනතුයෙ ධංමවිජයෙ (ධර්ම විජය ම විජය ලෙස සලකත්වා) ෂෙ හිදලොකික්‍ය පලලොකිකෙ‍්‍ය ෂවා ච තං නිලති හොතු උයාමලති ෂා හි හිදලොකික පලකොකික්‍යා' (එය මෙලොවට හා පරලොවට යහපත් වන්නේය. උත්සාහයෙහි ඇලීම සියලු ම ප්‍රීතිය වේවා. එය මෙලොවට හා පරලොවට යහපත් වන්නේය) යනුවෙනි. මේ අනුව රජුගේ අවසාන පරමාර්ථය වී ඇත්තේ දිග්විජය ප්‍රතිපත්තිය සම්පූර්ණයෙන් ම ප්‍රතික්ෂේප කොට ඒ වෙනුවට ධර්ම විජය ප්‍රතිපත්තිය අනුගමනය කිරීමට සියලු රටවැසියන්ට අනුශාසනා කිරීමයි.



13 වෙනි ගිරිනාර් ගිරි ලිපියෙන් අශෝක රජුගේ අභිෂේකයෙන් 8 වෙනි අවුරුද්දේ දී ආරම්භ වූ කාලිංග යුද්ධයේ දී සිදු වූ ලක්‍ෂ සංඛ්‍යාත මහා ව්‍යසනය නිසා පශ්චාත්තාපයට සහ ශෝකයට පැමිණ නැවත එබඳු ජයග්‍රහණයක් අපේක්‍ෂා නොකළ රජු ධර්ම විජයම ශ්‍රේෂ්ඨ බව අවබෝධ කරගන්නා ලදි. එහි ප්‍රතිඵලයක් වශයෙන් සිය රාජ්‍යයෙහිත් ආසන්න රාජ්‍යවලටත් ධර්මවිජය ප්‍රීති රසය බෙදා දීම සඳහා ධර්ම දූතයන් පිටත් කර යැවීමේ උදාර ධර්මදූත මෙහෙය පිළිබඳ තොරතුරු මෙම ලිපියෙහි මැනවින් පැහැදිලි කෙරේ.

## ආන්තික සටහන්

1. Indo-Iranian Journal, Aśoka's Thirteen Rock Edict, Kenneth Robert Norman, 1957, pp. 459-484.
2. ශිලා ලේඛන සංග්‍රහය, අශෝක ලිපි, සංස්. ඩී.ඊ. වික්‍රමසූරිය, ස්වදේශ මිත්‍රයා මුද්‍රණය, කොළඹ, 1929, 47-48 පිටු, The Edicts in King Ashoka, tr. Ven. S. Dhammika, Buddhist Publication Society, Kandy, 1993.
3. අශෝක ශිලා ලේඛන, බෙල්ලන ඤාණවිමල හිමි, සමයවර්ධන ප්‍රකාශන, කොළඹ 10, 7-8 පිටු.